**ශීර්ෂය 257 - කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

-----------------------------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

---------------------

1.1 **තත්ත්වාගණනය කළ මතය**

-------------------------------------

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කළුතර දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-------------------------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

-----------------------------------------------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේදී එම වත්කම් වලට අදාල ප්‍රධාන ලෙජර සමග කේවල වත්කම් වටිනාකම් පරීක්ෂා කිරීම සඳහා අදාල වත්කම් ලේඛන නඩත්තු කර නොතිබීම හේතුවෙන් 2018 ජනවාරි 01 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වත්කම් ශේෂවල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය. | 2018 නොවැම්බර් 28 දිනැති අංක 267/2018 දරන චක්‍රලේඛයේ 3.3 වගන්තියට අනුව මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේදී එම වත්කම්වලට අදාල ප්‍රධාන ලෙජර් ශේෂ වටිනාකම සමග කේවල වටිනාකම පරීක්ෂා කර බලා එම වටිනාකම් සැසඳෙන බව තහවුරු කරගත යුතු අතර නොසැසඳෙන යම්කිසි ශේෂ වේනම් එම ශේෂ හඳුනාගන්නා තෙක් ජ' නල් සටහන් මගින් එම වටිනාකමින් ප්‍රධාන ලෙජර ශේෂය සංශෝධනය කල යුතු වීම. | අදහස් දැක්වීමක් සිදුකර නොතිබුණි. |

1.6.2 **තැන්පතු**

**----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| වර්ෂ දෙක ඉක්මවූ රු. 26,762,340 ක් වූ තැන්පතු හා වර්ෂ 10 ඉක්මවූ රු. 5,635,723 ක්වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කල යුතු වීම. . | නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. |

1.6.3 **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.**

-----------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ------------------------------- | ------------------------------------- | ------------------------------------------- |
| (අ) ස්ථාවර වත්කම් ලේඛනය | | |
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 502 (2) ප්‍රකාර, එහි 11 වැනි පරිශිෂ්ඨයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 502 (2) ප්‍රකාර, එහි 11 වැනි පරිශිෂ්ඨයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතුය. | සිගාස් වැඩසටහන තුල ස්ථාවර වත්කම් මොඩියුලය සකසා ඇති බැවින් ස්ථාවර වත්කම් ලේඛනය තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් නොමැත. |
| (ආ) විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | | |
| මුදල් රෙගුලාසි 454 (2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 454 (2) හි සඳහන් පරිදි රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොතක් පවත්වා ගත යුතුය. | සිගාස් වැඩසටහන තුල ස්ථාවර වත්කම් මොඩියුලය සකසා ඇති බැවින් ස්ථාවර වත්කම් ලේඛනය තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් නොමැත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවීමට තිබූ අතැති බිල්පත් වටිනාකම ඉක්මවා රු.මිලියන 987.03ක අග්‍රිම ඉල්ලුම් කර තිබීම හේතුවෙන් ඇස්තමේන්තු පිළියෙල කිරීම හා ප්‍රතිපාදන කළමනාකරණය සතුටුදායක මට්ටමක නොවීය. | මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව හැකිතාක් දුරට නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කිරීම හා ප්‍රතිපාදන කළමනාකරණය සැලසුම් සහගතව කලයුතු බව. | ශීර්ෂ 257 හා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වැය ශීර්ෂ 47 ක් වෙනුවෙන් අක් මුදල් ඉල්ලුම් කිරීමට සිදුවී ඇත. කෙසේ වෙතත් ඉදිරි වර්ෂවල මෙම තත්ත්වය හැකිතාක් අවම කිරීමට කටයුතු කිරීම. |

### 2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන උපයෝජනය

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 ක 2017 වර්ෂය තුල සිදුවූ ගංවතුර, නාය යාම් සහ නාය යාමේ අධි අවදානම හේතුවෙන් ඉවත් කිරීමට හඳුනාගෙන තිබූ පවුල් 1,191 අතරින් පවුල් 699 ක් නැවත පදිංචි කිරීම සඳහා 2017 හා 2018 වර්ෂ තුල වැයකර ඇති රු. මිලියන 624.39 ක මුදල පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නැවත පදිංචි කිරීම සඳහා හඳුනාගෙන තිබූ පවුල් 1,191 අතරින් පවුල් 699 ක් පමණක් නැවත පදිංචි කිරීමේ කටයුතු ආරම්භ කර තිබීම. | ඉතිරි පවුල් 492 ද හැකි ඉක්මනින් නැවත පදිංචි කිරීමට කටයුතු කිරීම. | නැවත පදිංචි කිරීම සඳහා 2018 ජුනි 31 ට හඳුනාගත් පවුල් සංඛ්‍යාව 1,444 ක් වූ අතර ඉන් පවුල් 1,159 ක් ඒ සඳහා කැමැත්ත පලකර තිබුණි. මේ අතරින් පවුල් 462 ක් නැවත පදිංචි කිරීමට මේ දක්වා කටයුතු කර නැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගංවතුරින් පූර්ණ හානියට පත් නිවාස සහ නාය යාමෙන් පූර්ණ හානියට පත් නිවාස 136 වෙනුවෙන් ප්‍රථමයෙන් නිවාස ඉදිකිරීම වෙනුවට නායයාමේ අවදානම් කලාපවල පවතින නිවාස ඇතුළුව සියළුම නිවාස එකවර ඉදිකිරීමට සැලසුම්කර තිබීම. | ගංවතුරින් සහ නායයමෙන් පූර්ණ හානියට පත් නිවාස පළමුව ඉදිකිරීමට ඇති හැකියාව සොයා බැලීම. | පැහැදිලි කිරීමක් ඉදිරිපත් කර නැත. |
| (ඇ) | රජයේ ඉඩම්වල සහ ප්‍රතිලාභීන් සතු ඉඩම්වල රජයේ ප්‍රතිපාදන මත නිවාස ඉදිකිරීමේදී 2017 සහ 2018 වර්ෂ තුල පළමු වාරිකය ලෙස රු. 200,000 බැගින් රු. මිලියන 5.2 ක ප්‍රතිලාභ ලබාගෙන තිබූ පවුල් 26 ක් මේ දක්වා ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබීම. | අත්තිකාරම් ලබාදීමේදී වැඩ ආරම්භ කිරීම සඳහා නිශ්චිත කාලයක් ලබාදිය යුතු බව හා ඒවා නිතර නිතර අධීක්ෂණය කළ යුතු බව. | ප්‍රතිලාභීන් කැඳවා ඉදිකිරීම් ආරම්භ කරන ලෙස දන්වා තිබූ නමුත් අසනීප තත්ත්වය හා කටයුතු කිරීමට කිසිවකු නොමැති බව දන්වා ඇත. කෙසේ වෙතත් මේ වනවිට කිහිප දෙනකු ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. |
| (ඇ) | රජයේ ඉඩමක, ප්‍රතිලාභීන් සතු ඉඩමක සහ රජයේ මූල්‍යාධාර මත ප්‍රතිලාභීන් මිලටගත් ඉඩමක රජයේ මූල්‍යාධාර වලින් ඉදිකිරීමට ලබාදුන් රු.මිලියන 121.2 ක මුදලින් රු. මිලියන 33.4 ක් වැයකර ඉදිකිරීම ආරම්භ කර තිබූ නිවාස 167 ක ඉදිකිරීම් කටයුතු මේ වන විට අත්තිවාරමට පමණක් සීමා වී තිබීම. | නිවාස ඉදිකිරීමේ කටයුතු විධිමත් ලෙස අධීක්ෂණය කළයුතු බව. | ප්‍රතිලාභීන් කැඳවා ලිඛිතව උපදෙස් දී ඇත. මෙම තත්ත්වය ප්‍රතිලාභීයාගේ ප්‍රමාදය හා දුර්වලතා මත සිදුවී ඇති බව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | අධි අවදානම් කලාපවල පවත්නා නිවාසවල නැවත පදිංචිය වැලක්වීම සඳහා එම නිවාස සහ ඉඩම් රජයට පවරා නොගැනීම සහ පවරා ගන්නා ලද ඉඩම් අතරින් පර්චස් 20 ට වඩා ඉඩකඩ සහිත නිවාස හා ඉඩම් සම්බන්ධයෙන් තක්සේරු වටිනාකමට වන්දි ගෙවා නොතිබීම. | 2017 ජූලි 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ඉඩම් පවරාගැනීම සහ වන්දි ගෙවීම කළයුතු බව. | ඉඩම් පවරාගැනීමේ ක්‍රමවේදයන් මේ දක්වා සකස් වී නොමැති බැවින් මේ පිළිබඳ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත දැනුම්දී ඇත. |
| (ඊ) | ආපදා කළමනාකරණ අමාත්‍යාංශ මාර්ගෝපදේශවලට අනුව ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් නැවත පදිංචි කිරීම සඳහා ඉඩම් හඳුනාගැනීමේදී උපයෝගීතාවය අනුව ප්‍රවාහන, වාණිජ, ජලය, විදුලිය සහ ප්‍රවේශ මාර්ග යන පොදු අවශ්‍යතාවයන් පහසුවෙන් සලසාගත හැකි ඉඩම් තෝරාගැනීමට කටයුතු කර නොතිබීම. | ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ මාර්ගෝපදේශවලට අනුව ප්‍රාදේශීය ලේකම්වරු කටයුතු කළයුතු බව. | නැවත පදිංචිකිරීමේ කටයුතු සඳහා ප්‍රමාණවත් සුදුසු ඉඩම් කළුතර දිස්ත්‍රික්කය තුල නොමැත. පදිංචි කිරීම සඳහා තෝරාගත් ඉඩම්වල මූලික පහසුකම් සකස්කරමින් පවතී. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත ප්‍රතිලාභ ලැබී නොතිබීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|

| | | | |
|---|---|---|---|
| (අ) | පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 836 ඊ පැළැඳ බටහිර ග්‍රාම නිලධාරී වසමේ පැලන්වත්ත ඉඩමෙන් වර්ෂ 2003 – 2012 අතර කාලය තුල ඉඩම් කැබලි 181 ක් රණවිරුවන් සඳහා ලබාදී තිබූ නමුත් ඉන් ඉඩම් කැබලි 20 ක පමණක් රණවිරුවන් පදිංචි වී සිටී. | අවශ්‍ය යටිතල පහසුකම් ලබාදීමට කටයුතු කර රණවිරුවන් පදිංචි කිරීමට කටයුතු කළයුතු බව. | ඉඩම් කට්ටි 4ක් ව්‍යාපාරික කටයුතු සඳහා වෙනත් අයට පවරා තිබුණි. මෙහි යටිතල පහසුකම් සැපයීම රණවිරු සේවා අධිකාරිය විසින් කලයුතු බැවින් ඔවුන් දැනුවත් කර ඇත. මේ අතර ඉඩම් කට්ටි දෙකක් වෙනත් අයට පවරා තිබූ අතර එක් ඉඩම් කට්ටියක් ඥාති සහෝදරයෙකුට ලබාදී තිබුණි. |
| (ආ) | ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 620 ජී මහ ඉංගිරිය ග්‍රාම නිලධාරී වසමට අයත් ඉමගිර ඉඩමෙන් කැබලි 22ක්ද, 620 නිමලගම ග්‍රාම නිලධාරී වසමේ ඇඳුරුගල වත්තෙන් ඉඩම් කැබලි 26 ක්ද වශයෙන් ඉඩම් කැබලි 48 ක් 2010 වර්ෂය තුල රණවිරුවන් සඳහා ලබාදී තිබුණි. මෙම ඉඩම් කැබලි අතරින් මේ වන විට ඉඩම් කැබලි 13ක පුද්ගලයන් පදිංචි වී ඇති අතර ඒ සඳහා හිමිකම් ඔප්පු මේ දක්වා ලබාදී නොතිබුණි. | කඩිනමින් හිමිකම් ඔප්පු ලබාදී රණවිරුවන් පදිංචි කිරීමට කටයුතු කළයුතු බව. | මේ වන විට ඉඩම්ලාභීන් සඳහා හිමිකම් පත්‍ර ලබාදීමට ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යැවිය යුතු ලේඛන සකස් කරමින් පවතී. සංවර්ධනය නොකල ඉඩම්වල කට්ටිකරුවන්ට පදිංචිය සඳහා නිශ්චිත කාලයක් ලබාදී පදිංචි නොවන්නේ නම් වෙනත් සුදුසු ප්‍රතිලාභීන්ට එම ඉඩම් බෙදාදීමට කටයුතු කරමි. |
| (ඇ) | අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 829 බී කැකුළන්දල ග්‍රාම නිලධාරී වසමට අයත් පිඹුරවත්ත කපුහේන ඉඩමෙන් ඉඩම් කැබලි 81 ක් 2009 දෙසැම්බර් 08 දින රණවිරුවන්ට ලබාදී තිබූ නමුත් මේ වන විට එහි පදිංචිව සිටින්නේ පවුල් 3ක් පමණි. මෙම ඉඩම් අතරින් ඉඩම් කිහිපයක් මේ වන විටත් විකුණා තිබූ බව නිරීක්ෂණය විය. | රණවිරුවන් පදිංචි කිරීමට කටයුතු කළ යුතු අතර විකිණීමට නොහැකි පරිදි පාලන ක්‍රමයක් ඇති කළයුතු බව. | යටිතල පහසුකම් නොමැති බැවින් පදිංචි වී නැත. ඉදිරියේදී යටිතල පහසුකම් ලබාදීමට වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. තවද පදිංචි නොවන රණවිරුවන්ගේ ඉඩම් අළුතින් ඉල්ලුම් කරන රණවිරුවන්ට ලබාදීමටද අපේක්ෂිතය. |

## 3.2 ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව සිව්මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු. මිලියන 108.48 ක මුදලකට 2017 පෙබරවාරි 13 දින ආරම්භ කර තිබුණු අතර එය 2018 මැයි 20 දින වන විට වැඩ අවසන් කළ යුතුව තිබුණි. නමුත් මෙහි වැඩ අතරමග නවතා දමා තිබුණු අතර නිමකර තිබුණේ මුළු වැඩ ප්‍රමාණයෙන් සියයට 22.5 ක ප්‍රමාණයක් පමණක් වූ අතර ඒ සඳහා රු. මිලියන 42.9 ක මුදලක් වියදම් කර තිබුණි. | කොන්ත්‍රාත් ප්‍රදානයේදී කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් නිසි ඇගයීමක් සිදුකළ යුතු අතර ඇස්තමේන්තු සැකසීමේදී ශක්‍යතා අධ්‍යයනයක් කළයුතු බව. | කොන්ත්‍රාත් ආයතනයේ මූල්‍ය අපහසුතා නිසා කොන්ත්‍රාත් වැඩ අතරමග නතර වී ඇත. කෙසේ වෙතත් නැවත මිල ගණන් කැඳවීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. |

## 3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ආරම්භ කර තිබූ ව්‍යාපෘති 04 ක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණු අතර මේ සඳහා රු. මිලියන 8.53 ක මුදලක් වියදම් කර තිබුණි. | කඩිනමින් ඉදිකිරීමේ කටයුතු අවසන්කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කලයුතු බව. | ඉතිරි අදියර ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට දැනුම්දී ඇති බව හා 2018 සිංහරාජ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන සඳහා අනුමැතිය ලබාගැනීමට යවා ඇති බව. |

## 3.4 ප්‍රසම්පාදනයන්

(අ) මතුගම මල්වතුකන්ද පාලම ඉදිකිරීම සඳහා 2018 වර්ෂය තුල ලබාදී තිබුණු රු. මිලියන 5.76 ක් වූ කොන්ත්‍රාත්තුව සඳහා තෝරාගෙන තිබුණු කොන්ත්‍රාත්කරුගේ සුදුසුකම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරුණි.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | තෝරාගෙන තිබූ කොන්ත්‍රාත්කරුට ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) C6 හෝ ඊට ඉහළ ශ්‍රේණියක් නොතිබීම. | ලංසු ලේඛන (Bidding Document) 4.2 හි කොන්ත්‍රාත්කරුට ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) C6 හෝ ඊට ඉහළ ශ්‍රේණියක් තිබිය යුතු බව. | කුඩා පාලම් ඉදිකිරීමේදී පාලම් ඉදිකිරීම සම්බන්ධයෙන් ඉහළ තාක්ෂණයක් භාවිතා නොවන බැවින් මෙම ව්‍යාපෘතිය සඳහා විවෘත ඉදිකිරීම් ශ්‍රේණි සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකර ඇත. |
| (ii) | ලංසු ලේඛනවල කොන්දේසි අනුව මෙම කාර්යය සඳහා සිවිල් ඉංජිනේරුවරයකු සිටිය යුතු වුවද ඉදිරිපත් කර තිබූ ලේඛනවලට අනුව මොරටුව විශ්ව විද්‍යාලයේ ඩිප්ලෝමා සහතිකය සහිත අයෙකු පමණක් අදාල ආයතනයේ සේවයේ නිරතව ඇති බව නිරීක්ෂණය වීම. | ලංසු ලේඛන (Bidding Document) 4.4 අනුව සිවිල් ඉංජිනේරුවරයකු (BSC) සිටියයුතු බව. | කොන්ත්‍රාත් ආයතනයේ කටයුතු කරන ඉංජිනේරුවරයා 1986 සිට මාර්ග සංවර්ධන අධිකාරියේද 2013 වර්ෂයේ සිට පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේද කටයුතු කර ඇති බැවින් මොහුට පලපුරුද්දක් ඇත. |
| (iii) | ඉදිරිපත් කර තිබූ ලේඛනවලට අනුව පාලම් ඉදිකිරීම පිළිබඳව කොන්ත්‍රාත්කරුට පලපුරුද්දක් නොතිබීම. | ලංසු ලේඛන (Bidding Document) 4.4 අනුව පසුගිය වර්ෂ 10 තුල පාලම් ඉදිකිරීම පිළිබඳ කොන්ත්‍රාත්කරුට පලපුරුද්දක් තිබියයුතු බව. | ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක පාලම් ව්‍යාපෘතිය නියමිත කාලය තුල අවසන් කර තිබීම. |
| (iv) | ඉදිරිපත් කර ඇති ලේඛනවලට අනුව සමාගම් රෙජිස්ට්‍රාර් විසින් නිකුත්කල සහතිකයක් නොතිබීම. | බිලියන 05 ට වැඩි ව්‍යාපෘති සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් විසින් 1987 අංක 43 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 ඡේදය යටතේ නිකුත් කළ සහතිකයක් ඉදිරිපත් කලයුතු බව. | සහතිකයක් ඉදිරිපත් කර නැති බැවින් මින් ඉදිරියට එවැනි සහතිකයක් ලබාගැනීමට කටයුතු කරමි. |

(ආ) කළුතර සිරිකුරුස දේවස්ථානය ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය සිදුකෙරේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කළුතර සිරිකුරුස දේවස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2018 වර්ෂය තුල මධ්‍යම සංස්කෘතික අරමුදලින් ලැබී තිබූ රු. මිලියන 1.44ක මුදල නිදහස් කිරීමේදී ටෙන්ඩර් පටිපාටිය හෝ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණි. | රජයේ මුදල් භාවිතයේදී ප්‍රසම්පාදන විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු බව. | මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂකගේ (ආගමික හා කලා කටයුතු ) 2018 ඔක්තෝබර් 18 දිනැති ඩී/සීඕ/01/08 දරන ලිපියෙන් ටෙන්ඩර් පරිපාලනයෙන් හෝ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ගෙවීම් කරන ලෙස දක්වා තිබුණි. |

## 3.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කළුතර දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී වසම්වලට අනුයුක්ත ග්‍රාම නිලධාරී, සංවර්ධන නිලධාරී, සමෘද්ධි නිලධාරී සහ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන්ට පහසුකම් සහිත කාර්යාල ලබාදීමේ අරමුණින් 2017 වර්ෂය තුල ඉදිකර තිබූ නිල සෙවන කාර්යාල 40 අතරින් රු. මිලියන 70 ක් වැයකර ඉදිකර තිබූ නිල සෙවන කාර්යාල 35 ක් මේ දක්වා භාවිතයට ගෙන නොතිබුණි. | වැඩ අවසන් කර ඇති නිලසෙවන කාර්යාල කඩිනමින් නිලධාරීන්ට භාවිතයට ගැනීමට කටයුතු සැලසීම. | නිල සෙවන කාර්යාල 40 අතරින් 5 ක් විවෘත කර ඇත. ඉතිරි නිලසෙවන කාර්යාල 35 විවෘත කිරීම සඳහා ආසන සංවිධායකවරුන්ගෙන් දින ලබාගැනීමට කටයුතු කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුල රු. මිලියන 8.73 ක් වැයකර ඉදිකරමින් පවතින ඉත්තැපාන ආදාහනාගාරයේ ඉදිකිරීම් අවසන් කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිකිරීම් අවසන් කර ආදාහනාගාරය ප්‍රාදේශීය සභාවට පැවරීමට කටයුතු කලයුතු බව. | පළාත් සභා ප්‍රතිපාදන යටතේ ආදාහනාගාරයේ දාහකය සහ චිමිනිය සකස්කිරීම සඳහා වලල්ලාවිට ප්‍රාදේශීය සභාව විසින් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත. |
| (ඇ) | පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල 2017 වර්ෂය තුල රු. මිලියන 8.78 ක් වැයකර ඉදිකර තිබූ සුරක්ෂිත මධ්‍යස්ථානය ආපදා සිදුවූ අවස්ථාවලදී භාවිතයට ගතහැකි පරිදි නඩත්තු කටයුතු සිදුකර නොතිබුණි. | නඩත්තු කටයුතු වෙනුවෙන් නිසි ක්‍රමවේදයක් සකස් කර එය ක්‍රියාත්මක කිරීම | මේ වන විට ආර්ථික සංවර්ධන නිලධාරී සහ සමෘද්ධි නිලධාරී කාර්යාල පවත්වා ගෙන යන අතර ඉදිරියේදී වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට කටයුතු කරමින් පවතී. |

## 3.6 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල හතරක රු. මිලියන 2.62 ක අලාභ හානි නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අලාභ හානි හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කලයුතු බව. | පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කරමින් පවතී. |

## 3.7 කළමනාකරණ දුර්වලතා

කළුතර දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් සම්බන්ධයෙන් පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14 තුල අනවසරයෙන් අල්ලාගෙන ඇති බවට හඳුනාගෙන තිබූ ඉඩම් කට්ටි 11,225 අතරින් සමාලෝචිත වර්ෂය තුල ඉඩම් කච්චේරි 73ක් පවත්වා ඉඩම් කැබලි 759 ක් පමණක් නියමානුකූල කර තිබුණි. | අනවසර ඉඩම් නියමානුකූල කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළයුතු බව. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) විසින් මෙම තොරතුරු නිවැරදි බව සනාථ කර ඇත. |

## 3.8 වත්කම් උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා වර්ෂ 1987 සිට 2006 අතර කාලය තුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 5ක ඉඩම් හෙක්ටයාර 460.2961ක් විවිධ රාජ්‍ය ආයතන විසින් අත්පත්කරගෙන තිබූ නමුත් මේ දක්වා ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමට පෙර ව්‍යාපෘති වාර්තා සකස්කර ප්‍රතිපාදන වෙන්කරවා ගැනීමට කටයුතු කළයුතු බව. | ඉඩම් අත්පත් කරගෙන තිබූ නමුත් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි. |

## 4. **තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණ** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| තිරසාර සංවර්ධනයක් 2030 දී සාක්ෂාත් කර ගැනීමේ අරමුණු පෙරදැරි කරගෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ප්‍රාදේශීය තිරසර සංවර්ධන සැලසුම් සකස් කිරීමෙන් පසු එය පදනම් කරගෙන කළුතර දිස්ත්‍රික්කය සඳහා තිරසර සංවර්ධන සැලැස්ම සකස් කරන බවට 2018 වර්ෂය තුල එකඟ වී ඇත.එසේ නමුත් මේ දක්වා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තිරසාර සංවර්ධන සැලසුම් සකස්කර නොතිබුණි. | කඩිනමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තිරසාර සංවර්ධන සැලසුම් සකස් කලයුතු බව. | ප්‍රාදේශීය ලේකම්වරුන්ට සැලැස්මක් සකස් කරන ලෙස දැනුම් දී ඇත. |